**ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන

ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැක. තවද, එ් හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ලැබීම් රු.මිලියන 37.48 ක් හා ගෙවීම් රු.මිලියන 64.41 ක් ලෙස දක්වා තිබුණ ද නිවැරදි ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 49 ක් හා රු.මිලියන73.2 ක් විය. | ශේෂ පරික්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. | විසර්ජන ගිණුම පිළියෙල කිරීමේදී සීමාවන් ලෙස මුදල් සටහන් පමණක් සැලකිල්ලට ගන්නා අතර ගිණුම් ඉදිරිපත් කිරීමේ දී ද එම වාර්තාකරණ ව්‍යුහයම යොදා ගන්නා ලදී. |
| (ආ) | මාසික ගිණුම් සාරාංශ අනුව වෙනත් ලැබීම් රු.මිලියන 107.91 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව එය රු.මිලියන 107.75 ක් විය. | නිවැරදිව වෙනත් ආදායම් ගිණුම්ගත කළ යුතුය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් තුළ ඇතුළත් නොවන මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමට අදාළ ශුද්ධ ආදායම ගළපා ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නව පරිපාලන සංකීර්ණ ඉදිකිරීම් වලට අදාළව සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රු.මිලියන 107.81 ක් වූ කෙරීගෙන යන වැඩ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයෙන් අත්හැරී තිබුණි. | කෙරීගෙන යන වැඩවල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වෙනමම ඉදිරිපත් කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී ප්‍රමාද දෝෂයක් සිදුව ඇති අතර නිවැරදි කළ අගය රු.135,201,204 ක් වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ රු.මිලියන 27.38 ක අත්තිකාරම් ශේෂ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අංක 250/2016 හා 2016 ජූනි 09 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් තැබිය යුතු වීම. | කුලී හා වැඩ අත්තිකාරම් ශේෂය රු. 26,039,146 ක් වේ. |

**1.6.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව නිලධාරීන් 06 දෙනෙකුට අදාළව අයවීම් හිඟහිට තිබුණු අත්තිකාරම් ශේෂවල එකතුව රු.308,280 ක් විය. එම ශේෂය වසර 01 සිට වසර 17 දක්වා පැරණි ශේෂ වුවද අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 ඡේදයේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | • 2019 මාර්තු 07 දින වන විට විශ්‍රාම ගිය නිලධාරින්ගේ සියළු හිඟ මුදල් අයකරගෙන අවසන්ව ඇති බවත්.<br>• සේවය හැර ගිය නිලධාරින් දෙදෙනාගෙන් එක් අයෙකු සඳහා වූ රු.59,465 සඳහා නඩුවක් විභාග වෙමින් පවතින අතර, ඉතිරි රු.33,320 මුදල අයකර අවසන්ව ඇති බවත්.<br>• වැඩ තහනම් කළ නිලධාරින්ගේ එක් අයෙකු සඳහා වූ රු.178,102 සඳහා නඩුවක් විභාග වන අතර, ඉතිරි ණයකරුගේ රු.33,952 න් රු.7,454 ක ශේෂයක් පමණක් පවතින බවත්. |
| (ආ) | නිලධාරින් 07 ක ගේ කේවල ණය ශේෂ හා සාමාජික ණය ලේඛනයට අනුව ණය ශේෂ අතර රු.73,262 ක වෙනසක් පැවතුණි. | ශේෂ සැසඳුම් කර නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | CC 10 ලේඛනය නිවැරදි කළ බව හා ඉදිරියේදි අඩුපාඩු නොකරන ලෙසට නිලධාරින් හට උපදෙස් දුන් බව. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට නිවාස නොවන ගොඩනැගිලි තුළ පැවති රු.මිලියන 487.38 ක් වූ කෙරීගෙන යන වැඩ වෙන්කර හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ වෙන්කර කෙරීගෙන යන වැඩ හෙළිදරව් කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදුව ඇති බවත්, නිවැරදි කළ ශේෂය රු.482,833,922 වන බව. |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත්පත් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 662.1 ක් වූ අතර සිගාස් (CIGAS) වැඩ සටහනට අනුව එය රු.මිලියන 524.36 | කෙරීගෙන යන වැඩ වල සමුච්චිත වටිනාකම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදුව ඇති බව. |

ක් ලෙස හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල ශූන්‍ය ලෙස ද දක්වා තිබුණි.

1.6.4 **අග්‍රිම ශේෂය**

--------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අක්මුදල් ගැළපුම් ගිණුමේ අත්තිකාරම් බී ගිණුම ලෙස රු.මිලියන 11 ක ශේෂයක් ගලපා තිබුණ ද එම ශේෂයේ නිවැරදිතාවය විගණනයට තහවුරු නොවිණි. | වටිනාකම් නිවැරදිව ගණනය කර ගැළපුම් කළ යුතු වීම. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ සම්පූර්ණ ලැබීම්වලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලැබීම් අඩු කළ පසු ඉතිරිය වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශේෂය ලබාගෙන ඇති බව. |

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | වර්තමානය වන විට මෙම ලේඛන නඩත්තු කරන බව. |
| (ආ) **උප පත්‍රිකා පොත් ලේඛන** | | |
| විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උප පත්‍රිකා ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 341 හි විධිවිධාන ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | වර්තමානයේ දී එය මුදල් රෙගුලාසි පරිදි යාවත්කාලීනව පවත්වා ගෙන යන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **මාණ්ඩලික නිලධාරින් සඳහා ලබාදෙනු ලබන අතුරු අග්‍රිම සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන අත්තිකාරම් ලේඛනය**<br>------------------------------------<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් මඟින් සියලු වැදගත් තොරතුරු ඇතුළත් කර අත්තිකාරම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | වැදගත් තොරතුරු හෙළිදරව් කෙරෙන ආකාරයට ලේඛනය යාවත්කලීනව නඩත්තු කළ යුතු වීම. | එහි පැවති අඩුපාඩු සම්පූර්ණ කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කළ බව. |
| (ඇ) | **ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය**<br>------------------------------------<br>ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.11.2 ප්‍රකාරව පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රජයේ මාර්ගෝපදේශ ප්‍රකාරව පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඉදිරියේදී මෙම පොත්පත් හා ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත උපදෙස් දුන් බව. |
| (ඉ) | **ලංසු කැඳවීමේ ලේඛනය**<br>---------------------------<br>ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.2.1 ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මෙම වර්ෂයේ සිට පවත්වාගෙන යා යුතු බවට නිලධාරීන් දැනුවත් කළ බව |
| (ඊ) | **චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනය**<br>------------------------------------<br>ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 388 ප්‍රකාරව චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 388 ප්‍රකාරව චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | එය පවත්වාගෙන යා යුතු බවට නිලධාරීන් දැනුවත් කළ බව |
| (උ) | **ග්‍රාම නිලධාරි පැමිණිලි සම්බන්ධයෙන් ලේඛනය**<br>------------------------------------<br>නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරි | ග්‍රාම නිලධාරි පැමිණිලි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. | මේ වන විට ගොනුවක් සහ ලේඛනයක් සකස් කර අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යාවත්කාලීනව පවත්වාගෙන |

| | | |
|---|---|---|
| පැමිණිලි සම්බන්ධයෙන් වූ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | | යාමට කටයුතු සලස්වා ඇති බව. |

**1.6.6 විගණන සාක්ෂි නොවීම**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------- | ----------- | ---------------------------------------- |
| ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලබා දුන් යතුරු පැදි / ස්කූටර් සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබාගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි . | 2015 ජූලි 07 දිනැති මුදල් අමාත්‍යාංශ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/GPS/130/9/14/M – ii දරන උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට ලබා ගන්නා ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී පූර්ණ රක්ෂනාවරණය පරික්ෂාවට ලක් නොවන බව හෙළි වී ඇති බවත් මෙය පාලනය කිරීමට හැකියාවක් නොමැති බව. |

**1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| -------------- | | ----------- | -------------------------- |
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව**<br>------------------------------------- | **අනුකූල නොවීම**<br>----------------- | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>-------------------------- | | | |
| **(i) මුදල් රෙගුලාසි 1645 (අ)** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2019 අගෝස්තු වන විට නිවැරදි කර ඇති බව. |
| **(ii) මුදල් රෙගුලාසි 1646** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2018 ජූලි සිට සැප්තැම්බර් දක්වා ධාවන | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>**---------------------------** | | | |
| | **(i) 2002 ජුනි 19 දිනැති අංක 1/2002 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය** | නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් 62 ක් වසර 05 සිට වසර 26 දක්වා කාලයක් අඛණ්ඩව එකම ස්ථානයේ සේවයේ නියුක්ත වී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. | සංවර්ධන නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ක්‍රමවේදයක් නොමැති බවත් ග්‍රාම නිලධාරීන් කොට්ඨාශ තුළ මාරුකර ඇති බවත්, අනෙකුත් නිලධාරීන්ගේ තොරතුරු ස්ථාන මාරුවීම් සඳහා යොමුකර ඇති බව. |
| | **(ii) 2013 ජුනි 12 දිනැති අංක HAF/01/01 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක නිලධාරීන් 12 දෙනෙකු දින 06 සිට දින 300 දක්වා කාල ප්‍රමාදයකින් පසු ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී අඩුපාඩු ඇති නොවන ලෙස කටයුතු කිරීමට උපදෙස් දුන් බව. |
| | **(iii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2 සිට 5 දක්වා කාල පරාසයක් තුළ වාහන ඉන්ධන පරික්ෂාවක් සිදු කර නොතිබුණි. | -එම- | වර්තමානයේදී ඉන්ධන දහනය පරික්ෂාව සිදුකිරීමට කටයුතු යොදා ඇති බව. |
| (ඇ) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**<br>**-----------------------** | | | |
| | **2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 3.2.6 ඡේදය** | ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2018 ජුනි 15 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | කාල ප්‍රමාදයක් සිදු වූ බව පිළිගන්නා බව. |
| (ඈ) | **ජාතික අයවැය චක්‍රලේඛ**<br>**--------------------------** | | | |
| | **(i) 01/2016 ජනවාරි 12 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛයේ** | | | |

| | | | |
|---|---|---|---|
| • **2.6 ඡේදය** | දීමනා ක්‍රමයෙන් ඉවත්කරන ලද දීමනා ලාභීන්ගේ දීමනා පත්‍රය අවලංගු කර සුරක්ෂිතව ගොනු කර තබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් කටයුතු කර නොතිබුණි. | -එම- | මින් ඉදිරියට දීමනා ලාභීන් මිය ගිය පසු එම කාඩ්පත කාර්යාලයට භාරදෙන ලෙසත් ඉවත්වන අයගේ දීමනා ගෙවීම් සහතික පත්‍ර අවලංගු කර වෙනම ගොනුකර තබා ගැනීමටත් උපදෙස් දුන් බව. |
| • **2.7 ඡේදය** | රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පදිංචිය හැර ගොස් හෝ මියගොස් මාස 06 සිට 08 අතර කාලයක් ගත වූ දීමනාලාභීන් ලේඛනගත කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. | අංක 1/368D/58 දරන දීමනා ලාභියා ග්‍රාම නිලධාරි දැනුවත් කිරීමෙන් පසු ජූලි මස සිට ලේඛනයෙන් ඉවත් කර ඇති බවත්, අංක 1/369/1 දරන දීමනාලාභියා මිය ගිය බව ග්‍රාම නිලධාරි වාර්තා කිරීමෙන් පසු මැයි මස සිට නතර කර ඇති බව . |
| • **2.14 ඡේදය** | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් මාස 03 ක් අඛණ්ඩව දිමනාව ලබා නොගත් දීමනා ලාභීන් ගෙවීම් ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි. | -එම- | තැපැල් කාර්යාලය දැනුවත් කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව |
| **(ii) 2015 ජූලි 07 දිනැති අංක BD/GPS/130/ 09/14/MC – ii උපදෙස් ලිපිය** | • ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් ක්ෂේත්‍ර නොවන රාජකාරි සඳහා මුදා හළ නිලධාරීන් 42 ක් සඳහා ලබා දී තිබූ යතුරුපැදි වෙනුවෙන් රු.5,861,940 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | **ගලේවෙල**<br>මුදල් නොගෙවන්නේ නම්, තාවකාලික මුදාහැරීම අවලංගු කර පෙර සේවයට නැවත කැඳවීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවට ලිඛිතව දන්වා ඇති බව,<br>**ලග්ගල**<br>ඉදිරියේදී වැටුපෙන් අයකර ගැනීමට ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් වෙත දන්වා යැවූ බව<br>**අඹන්ගග**<br>වැටුපෙන් රු.58,500 ක් අයකර ගැනිමටත් මාසික වාරික 60 කින් තවත් නිලධාරියකුගෙන් අයකර ගැනීමට ඉල්ලීම් ලිපි |

| | | | | |
|---|---|---|---|---|
| | | | | මුදල් අමාත්‍යාංශය වෙත යොමු කළ බවත් ඉතිරි ණය අයකර ගැනීමට නඩු පැවරීම කළ නොහැකි බවත්. |
| **(ඉ)** | 2008 ජුනි 13 දිනැති අංක LD – 1-34- (1) 2008 දරන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ හා ඉඩම් කොමසාරිස් ජෙනරාල්ගේ අංක 01/2018 හා 2018 මාර්තු 28 දිනැති චක්‍රලේඛය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක ග්‍රාම නිලධාරීන් 82 ක් විසින් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වාර්තා 1,449 ක් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. | නිවැරදි කිරීමට කටයුතු කළ බවත් , සියලුම ග්‍රාම නිලධාරින් දැනුවත් කර ඇති බව. |
| **(ඊ)** | 2010 ඔක්තෝබර් 20 දිනැති අංක 02 /06/02/09 (vii)-GSMB දරන පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක වැලි කැණිම් / ප්‍රවාහන බලපත්‍ර ගාස්තු, රු.109,334 ක් දින 05 සිට දින 187 දක්වා කාල ප්‍රමාදයකින් පසු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය වෙත ප්‍රේෂණය කර තිබුණි. | වැලි කැණිම් / ප්‍රවාහන බලපත්‍ර ගාස්තු ඊළඟ මාසයේ 10 දිනට ප්‍රථම ප්‍රේෂණය කළ යුතු වීම. | ඉදිරියේදී නියමිත දිනට ප්‍රේෂණය කිරීමට කටයුතු කරන බව |

**1.6.8 අවිධිමත් ගනුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

--------------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විධිමත් අනුමැතියක් නොමැතිව අවස්ථා 08 කදි වැඩිහිටි ආධාර ලෙස රු.182,400 ක් ගෙවීම් කර තිබුණි. | නිසි අධිකාරි බලයකින් යුතුව ගෙවීම් කළ යුතු බව. | මෙවැනි අතපසුවීම් නොවන ලෙසට කටයුතු කළ යුතු බවට උපදෙස් ලබා දුන් බව. |
| (ii) | සතුටුදායක ලෙස වැඩ නිම කර ඇති බවට කාර්මික නිලධාරි සහතිකය, ගෙවීම් සඳහා නිර්දේශය හා අනුමැතිය නොමැතිව මාතලේ ප්‍රදේශීය ලේකම් කාර්යාලය | මු. රෙ 237 උපලේඛන 1 (අ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී මෙම අඩුපාඩු මගහැරීමට කටයුතු කරන බවත් |

විසින් කර්මාන්ත 07 ක් සඳහා රු.1,718,520 ක් ගෙවා තිබුණි.

(ආ) **අනුමත නොකළ ගනුදෙනු**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | විල්ගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු.132,800 ක් වටිනා අඹ පැළ 600 ක් සඳහා අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි. | විධිමත් අනුමැතිය මත ගෙවීම් කළ යුතු වීම. | වැඩසටහන් 2 ක ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් වෙන වෙනම මෙම මිලදී ගැනීම සිදු කර ඇති බව. |
| **(ii)** | ලග්ගල - පල්ලේගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු.411,500 ක භාණ්ඩ ප්‍රාදේශිය ලේකම්ගේ අනුමැතියකින් තොරව ප්‍රතිලාභින් වෙත බෙදා දි තිබුණි. | 2017 අප්‍රේල් 01 හා අංක 5/4/RIDP/2017 දිනැති දිස්ත්‍රික් ලේකම්ගේ ලිපියෙහි උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. | අදාළ අනුමැතීන් හා නිර්දේශ ලබා නොගැනීම ප්‍රමාද දෝෂයක් මත සිදු වූ බව. |

(ඇ) **සහතික නොකළ ගනුදෙනු**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රත්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් යාවත්කාලීන කරන ලද ක්‍රියාකාරී සමිති ලැයිස්තුවේ ඇතුළත් නොවූ සමිති 06 ක් සඳහා රු.279,437 ක් වටිනා ද්‍රව්‍යාධාර ලබා දී තිබුණි. | ලියාපදිංචි සමිති ලැයිස්තුවේ ඇතුළත් සක්‍රීය ලෙස හඳුනාගත් සමිති සඳහා ද්‍රව්‍යාධාර ලබාදිය යුතු වීම. | අදාළ සමිති ලියාපදිංචි හා සක්‍රීය සමිති බව. |

(ඈ) **වංචනික ස්වරූපයේ ගනුදෙනු**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් | වැඩිපුර ලබාගත් යතුරුපැදි | ඉදිරියේ දී ඔවුන්ගේ |

| | | |
|---|---|---|
| කාර්යාලයේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් ලෙස හා මහජන නියෝජිතයන් ලෙස කටයුතු කරන නිලධාරින් දෙදෙනෙකු එම අවස්ථා දෙක යටතේ ම යතුරු පැදි ලබාගෙන තිබුණද රු.377,000 ක් ආපසු අයකර ගෙන නොතිබුණි | සඳහා වෙළඳපල වටිනාකම අයකර ගැනිමට කටයුතු කළ යුතු වීම. | වැටුපෙන් අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 වියදම් කළමනාකරණය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.මිලියන 154.98 ක් වූ ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා පිළිගත හැකි හේතු ඉදිරිපත් කර නොතිබුණි. | ඇස්තමේන්තු කිරීමේ දී හැකිතාක් නිවැරදිව කළ යුතු වීම. | අපේක්ෂිත වියදම් ඇතිනොවීම නිසා ප්‍රතිපාදන ඉතිරිවී ඇති බව |

**2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

---------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 47 කින් ලැබී තිබුණු එකතුව රු.මිලියන 2,105.89 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 35.1 ක් උපයෝජනය නොකර ආපසු යවා තිබුණි. ඊට අමතරව එකතුව රු.මිලියන 314.37 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නැවත පවරා නොතිබුණි. | අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රතිපාදන යෙදවිය යුතු අතර ඉතිරි ප්‍රතිපාදන වර්ෂය අවසාන වීමට ප්‍රථම අදාළ ආයතන වෙත නැවත පවරා දිය යුතු වීම. | අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ නොවීම නිසා මෙලෙස ප්‍රතිපාදන නැවත පවරා දීම සිදු වූ බව හා ප්‍රතිපාදන පවරාදීමට අදාළ ආයතන වෙත දැනුම් දි තිබුණ ද එය නැවත පවරාගත් බවට දැනුම් දීමක් කර නොතිබූ බව |
| (ආ) 2015 වර්ෂයේදී සංවර්ධන වැඩ වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවලින් ලැබී තිබුණු රු.320,814 ක් අදාළ කාර්යයන් සඳහා යොදා නොගෙන රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | අපේක්ෂිත සංවර්ධන කාර්යය සඳහා මුදල් යෙදවිය යුතු වීම. | තොරතුරු ලබාගනිමින් පවතින බවත්, ඉදිරියේදී පිළිතුරු ලබාදීමට කටයුතු කරන බව. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් අවස්ථා 39 කදී ලබාදුන් අතුරු අග්‍රිම දින 04 සිට දින 200 අතර කාල ප්‍රමාදයකින් පසු නිරවුල් කර තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අතුරු අග්‍රිම පියවීම ප්‍රමාදය වළක්වාලීමට නිලධාරීන් දැනුවත් කළ බව. |
| (ආ) | යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2017 හා 2018 වර්ෂවල අවස්ථා 06 කදී ලබා දී තිබූ එකතුව රු.243,640 ක අත්තිකාරම් වලින් සියයට 61 සිට සියයට 100 දක්වා අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර දින 1 සිට දින 13 ක් දක්වා කාලයක් අතරඳවාගෙන නැවත පියවා තිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන සැලසුම් කර අත්තිකාරම් ලබා ගැනිමට කටයුතු කළ යුතු වීම. | සැලැසුම් කළ දිනට වැඩසටහන නොපැවැත්වූ බවත් අත්තිකාරම් හිලව් නොකර වවුචරය සඳහා ගෙවීම හේතුවෙන් එම අත්තිකරම් අධිහාර කර ඇති බව. |
| (ඇ) | උකුවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකු වෙත අදාළ කාර්යයට දින 04 කට පෙර එකතුව රු.47,500 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | 2018 ජූනි අංක 03/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිලධාරීන් දැනුවත් කරන බවත්, අත්තිකාරම් ලේඛනයේ අනෙකුත් වැදගත් තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන කරන බව. |
| (ඈ) | අඹන්ගගකෝරලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකුට අවස්ථා 03 කදී ලබාදී තිබුණු රු.35,853 ක අත්තිකාරම් 2018 නොවැම්බර් 29 දින වනවිට දින 15 සිට දින 260 අතර කාලයක් ප්‍රමාද වී තිබුණ ද පියවා නොතිබුණි. | -එම- | ඉදිරියේදී නියමිත දිනට අත්තිකාරම් පියවීමට කටයුතු කරන බව. |

## 2.4 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පොදු තැන්පත් ගිණුම් ශේෂය තුළ වසර 1 සිට වසර 5 දක්වා නිරවුල් නොකළ ශේෂයන්ගේ එකතුව රු.13,193,346 ක් විය. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉඩම් වන්දි වසර 10 ක කාලයක් රඳවා ගත හැකි බව. |
| (ආ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කර්මාන්ත වෙනුවෙන් වර්ෂ 01 කට වැඩි කාලයක් රඳවාගෙන තිබුණු තැන්පතු රු.533,424 ක් නිරවුල් කර නොතිබුණි. | මු. රෙ 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ වන විට අතරඳවාගැනීම් නිදහස් කර ඇති බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මේ සැලැසුම් අංශයට අදාළව හිස් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණ ද සැලසුම් අංශයේ නිලධාරින් 48 ක් ක්ෂේත්‍ර කටයුතු සඳහා යොදවා තිබුණි. | චක්‍රලේඛය පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වීම. | ප්‍රමාද දෝෂයකින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැති බව හා ව්‍යාපෘති 110 ක් ඉටුකර ඇති බව. |
| (ආ) දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු. මිලියන 20 ක් වූ කාර්යයන් 33 ක් වෙනුවෙන් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේදී එය පිළියෙල නොකළ බව හා 2019 වර්ෂයේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සඳහා උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු රු. මිලියන 45.82 ක ප්‍රතිපාදන එම ව්‍යාපෘති සඳහා උපයෝජනය නොකර දිස්ත්‍රික් ලේකම් වෙත නැවත පවරා දී තිබුණි. | අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නැවැත්වීමට ලද උපදෙස් හා මහපෙන්වීම මත විෂය පථයෙන් බැහැර කරුණු මත භාවිතා නොකළ ප්‍රතිපාදන බවත්, ඒවා විධිමත්ව පවරා දුන් බව. |
| (ආ) | භාණ්ඩ හා සේවා සපයා නොතිබියදී ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම වෙනුවෙන් රු.87,465 ක් වටිනා චෙක්පත් 03 ක් ලියා අතරඳවාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 137 (2) හා (5), 215 (1) (3) මු. රෙ 237 පරිදි කටයුතු කළ යුතු වීම. | පිරිවිතරයන්ට අනුකූලව අදාළ සැපයුම් ලැබීමෙන් අනතුරුව 2019 පෙබරවාරි 28 දින හා 2019 මාර්තු 05 දින චෙක්පත් නිකුත් කර ඇති බව. |
| (ඇ) | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් පවරා ගැනීම් කටයුතු ප්‍රමාද වීම නිසා රු.මිලියන 13.49 ක වන්දි මුදලක් පොදු තැන්පත් තුළ රඳවාගෙන තිබුණි. | වන්දි ගෙවීම් කඩිනම් කර අදාළ සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | වන්දි හිමිකරුවන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කරන බව |
| (ඈ) | වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන හා ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය වැඩසටහන සඳහා ලැබී තිබුණු පිළිවෙලින් රු.මිලියන 53.31 ක් හා රු.මිලියන 151.61 ක් ලෙස උපයෝජනය කර නොතිබුණි. | ලැබෙන ප්‍රතිපාදන වර්ෂය තුළ දීම සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවිය යුතු වීම. | රාජ්‍ය ප්‍රතිපත්තිමය තිරණ පදනම්ව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නැවැත්වීම හේතුවෙන් ඉතිරි වූ බවත් එම ප්‍රතිපාදන නැවත පවරා දී ඇති බවත්. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|

| | | |
|---|---|---|
| විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සපයා සවිකරන ලද ප්‍රතිආශ්‍රැතකරණ ජල පිරිපහදු ඒකක දෙක අපේක්ෂිත ධාරිතාවයෙන් තොරව සපයා තිබියදී ඒ සඳහා රු.702,000 ක් ගෙවීම් කර තිබුණි. | ඇණවුම් කළ පිරිවිතරයන් අනුව භාණ්ඩ සපයා ඇති බව තහවුරු කරගෙන ගෙවීම් කළ යුතු වීම. | පිරිපහදු ජල ප්‍රමාණය ලිටර 90 ක් බව මාතලේ දිස්ත්‍රික් ඉංජිනේරු මහතා සනාථ කර ඇති බවත්, ජල මූලාශ්‍ර වල ධාරිතාවය හා ජලයේ ගුණාත්මක භාවය මත එය වෙනස්විය හැකි බවත් , විගණන අවස්ථාවේදී ප්‍රමාණය අඩු වීමට මෙම සාධක බලපා ඇති බව විශ්වාස කරන බව. |

## 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රත්තොට මාඋස්සාගොල්ල ලාක්ෂා ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් ලබාදී තිබූ රු.4,895,250 ක ප්‍රතිපාදනයෙන් රු.1,386,325 ක් වැයකර තිබූ අතර ප්‍රමාණ පත්‍රයේ වූ වැඩ විෂයයන් 65 කින් 12 ක් පමණක් ඉටුකර තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කාර්යයන් ගිවිසුම්ගත දිනට අවසන් කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණ පදනම්ව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නැවැත්වීම හේතුවෙන් ඉතිරි වී ඇති බවත්, එම ප්‍රතිපාදන නැවත පවරා දී ඇති බවත්. |
| (ආ) | අළුගොල්ල මාලිගාතැන්න හා පිළිහුඩුගොල්ල පහළ ජල යෝජනා ක්‍රම සඳහා එකතුව රු.684,483 ක් ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට නිදහස් කර තිබුණ ද යෝජිත පවුල් 32 ක් සඳහා ජල සම්බන්ධතා ලබාදී නොතිබුණි. | ගිවිසුම්ගත කාල සීමාව තුළ කර්මාන්තය නිමකර අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළ යුතු වීම. | 2019 ජුනි 18 දින වන විට අරමුණුගත පවුල් 32 න් 27 ක් ජල සම්බන්ධතා ලබාගෙන ඇති බවත් ඉතිරි පවුල් 05 ආර්ථික අපහසුතාවය නිසා තවමත් ජල සම්බන්ධතාවය ලබාගෙන නොමැති බව. |
| (ඇ) | මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරළිය වැඩසටහන යටතේ රු.376,740 ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවා තිබුණද ප්‍රතිලාභී පවුල් 13 ක් සඳහා විදුලිය සපයා නොතිබුණි. | අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී නිසි සැලකිල්ලෙන් යුතුව ප්‍රතිලාභීන් තෝරාගත යුතු වීම. | ඉතා ඉක්මනින් විදුලිය ලබාදීමට කටයුතු කරන බව. |
| (ඈ) | නාඋල කරණමුලයාය ආදර්ශ ගම්මානයේ පවුල් 63 ක් සඳහා විදුලිය ලබාදීම වෙනුවෙන් ලංකා විදුලිබල | අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළ යුතු අතර | මේ වන විට ට්‍රාන්ස්ෆෝමරය සවිකිරීමට වලවල් සකස් කර විදුලි කණු ආදර්ශ ගම්මානය |

| | | |
|---|---|---|
| මණ්ඩලය වෙත 2018 වර්ෂයේ දෙසැම්බර් රු.4,680,778 ක් ගෙවා තිබුණ ද ඊට අදාළව මූලික වැඩ කොටස් ඉටුකර නොතිබුණි. | ප්‍රමාද කිරීම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | වෙත රැගෙන විත් කණු සිටුවා ආධාරක සවිකර ඇති බව හා ට්‍රාන්ස්ෆෝමරයක් සවි කර ඇති බව. |

**3.5 ප්‍රසම්පාදනයන්**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------------------------ |
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති සමිති 21 ක් සඳහා රු.මිලියන 10.44 ක් වටිනා කොන්ත්‍රාත් 21 ක් ප්‍රදානය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සමඟ පරිශීලනය කිරීම සඳහා ප්‍රසම්පාදන අත්පොතට නිකුත් කළ අතිරේක අංක 12 හි අංක 3.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පූර්ව ක්‍රියාකාරීත්වය පිළිබඳව සළකා බැලීමෙන් පසුව කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතු බව. ඉදිරියේ දි මේ පිළිබඳ විශේෂයෙන් සළකා බලා කටයුතු කරන බව. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය නොමැතිව වාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා රු.449,397 ක් වැය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 9.3.1 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති බව. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අඹන්ගග කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වාහන අලුත්වැඩියාවන්ට අදාළව ලියාපදිංචි සැපයුම් කරුවන්ගෙන් මිල ගණන් කැඳවා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා 3.4 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ලියාපදිංචි සැපයුම් කරුවන් 05 කට අඩු ප්‍රමාණයක් ලියාපදිංචි වී තිබීම, ප්‍රසම්පදන මාර්ගෝපදේශ පරිදි කටයුතු කරන බව. |
| (ඈ) | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රු.20,000 සිට රු.4,500,000 ක් දක්වා පරාසයක වූ ප්‍රසම්පාදන 33 ක් සම්බන්ධයෙන් දේශීය වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 2.14.1 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරි බලයේ සීමාව ඉක්මවන බැවින් සහ ප්‍රමාද දෝෂයන් මත දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇති බව. |

**3.6 වත්කම් කළමනාකරණය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | --------------------------------- |
| (අ) | ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වටිනාකම හෙළිදරව් නොකළ යන්ත්‍ර 02 ක් හා රු.134,000 | වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතු අතර එසේ නොහැකිනම් | මේස 15 ගබඩාවේ රඳවා ඇති බවත්, විදුලි පංකාව හා අධිපීඩන ජල පොම්පය භාවිතයට ගත් |

| | | | |
|---|---|---|---|
| | ක් වටිනා යන්ත්‍රයක් හා කාර්යාල උපකරණ 17 ක් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | අපහරණය සඳහා කටයුතු කළ යුතු වීම. | බවත්, අනෙකුත් යන්ත්‍ර අවශ්‍යතාවයක් ඇති රජයේ ආයතනයකට ලබාදීමට ඉදිරියේදී කටයුතු කරන බව. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක විෂයයන් 94 ක භාණ්ඩ ඒකක 209 කට වැඩි සංඛ්‍යාවක් සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කර තිබුණ ද ඊට අදාළව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | අපහරණය කිරීම් ජංගම වත්කම් සංචලන වාර්තාවට ගැලපිය යුතු වීම. | 2019 විසර්ජන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව |

**3.7** **රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | ------------------------------------ |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක නිලධාරීන් 23 දෙනෙකු විසින් රු. 61,000 ක ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාළ නිලධාරීන්ගෙන් වාරික වශයෙන් ඇප මුදල් අය කරගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි. |

**3.8** **පාඩු හා හානි**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------------------------ |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 ඔක්තෝබර් 25 දින අස්ථානගත වූ පරිගණකය වෙනුවෙන් රු.81,250 ක් අදාළ නිලධාරියාගෙන් අයකරගැනීමට තීරණය කර තිබුණ ද ඉන් රු.40,625 ක් පොතින් ඉවත්කිරීමට පසුව තීරණය කර තිබුණි. | පරීක්ෂණ මණ්ඩලයේ තීරණ වෙනස් කිරීමට හේතු දක්වා ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතු වීම.. | දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය මඟින් මෙම තීරණය ගෙන නිලධාරියා දැනුවත් කර ඇති බව. |
| (ආ) | යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 මැයි 20 දින අස්ථානගත වූ පිරිවැය රු.56,000 ක ටැබ් පරිගණකය වෙනුවෙන් රු.70,000 ක් | -එම- | නිලධාරියාගෙන් අයකිරීම අනුචිත බව හඳුනා ගැනීමෙන් අනතුරුව කපා හැරීමේ නියෝගය නිකුත් කළ බව . |

නිලධාරියාගෙන් අයකිරීමට කලින් තීරණය කර තිබුණ ද පිරිවැය වට්නාකම පොතෙන් කපාහැරීමට පසුව තීරණය කර තිබුණි.

**3.9 අනාර්ථික ගනුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අක්කර 50 මාර්ගය සහ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉටු නොකළ වැඩ සඳහා රු.68,590 ක ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීම හා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | නැවත පරීක්ෂාවක් කිරීමට 2019 ජූලි 30 දින විගණන කළමනාකරණ කමිටුවේදී තීරණය වූ බැවින් එම වාර්තාව ලබා ගැනීමට සටහන් කර ගතිමි. |

**3.10 කළමනාකරණ දූර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් මගින් රජයේ සංවර්ධන ව්‍යාපෘති 37 ක් වෙනුවෙන් ඉඩම් පවරාගැනීමේදී වර්ෂ 1 සිට වර්ෂ 43 දක්වා කාලයක් ගතවී තිබුණද එම පවරාගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ඉඩම් පවරාගැනිමේ කටයුතු කඩිනම් කළ යුතු වීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කටයුතු කරමින් පවතින බව |
| (ආ) | යටවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් එකම සමිති හෝ ආයතන 08 ක් සඳහා අවස්ථා 19 ක දී රු.349,000 ක් වූ ප්‍රතිලාභ ලබාදී තිබුණි. | ද්‍රව්‍ය හෝ උපකරණ ප්‍රතිලාභීන් අතර සාධාරණ ලෙස බෙදියන අයුරින් කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී එසේ නොවන ලෙසට කටයුතු කිරීමට සටහන් කරගත් බව. |
| (ඇ) | ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයක් රු.98,825 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණ ද ඊට අදාළව මිල ගණන් කැඳවා නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 ප්‍රකාරව මිල ගණන් කැඳවා අලුත්වැඩියාවන් සිදුකළ යුතු වීම. | 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය අනුව මිල ගණන් කැඳවීමේ අවශ්‍යතාවයක් නොමැති බව. |
| (ඇ) | රජයේ ආයතන විසින් පරිහරණය | ඉඩම් ආඥාපනතට අනුකූලව | මේ සම්බන්ධයෙන් ඉඩම් |

| | | | |
|---|---|---|---|
| | කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් සතු රජයේ ඉඩම් කට්ටි 21 ක් සම්බන්ධයෙන් වර්ෂ 12 ක් හෝ ඊට වැඩි කාලයක් ගතවී තිබුණ ද විධිමත්ව පවරා නොතිබුණි. | විධිමත්ව පවරා දීමට කටයුතු කළ යුතු වීම. | තක්සේරු හා මිනුම් කිරීමේ ආයතනය වෙත නැවත සිහිකැඳවීම් යැවීමට තිරණය කළ බව. |
| (ඉ) | ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවර්ධන යෝජනාක්‍රම වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු.445,873 ක් වටිනා භාණ්ඩ ඒකක 150 ක් 2019 පෙබරවාරි 12 දින වනවිටත් නිෂ්කාර්යව පැවතුණි. | භාණ්ඩ නිසි පරිදි අදාළ සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වීම. | අමානෝ තහඩු සහ ඇදි සහිත ප්ලාස්ටික් පුටු අදාළ සමිති වෙත බෙදා දී ඇති බව හා පිවිසි ජලනල ජල ව්‍යාපෘතිය නිමකරන තුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩා කර ඇති බව. |
| (ඊ) | කාර්යක්ෂමතා කඩඉම සමත්වූ නිලධාරීන් 17 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීමට අඹන්හග කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථිර කිරීමට කටයුතු කළ යුතු වීම. | පෞද්ගලික ලිපි ගොනු වල අඩුපාඩු හේතුවෙන් සේවය ස්ථිර කිරීමට මෙතෙක් නොහැකි වූ බව හා සේවය ස්ථිර කිරීම සඳහා නිලධාරීන් 08 කගේ ලිපිගොනු දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බව. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන අරමුණු වලට අදාළ සැලැසුම් සකස් කර නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ 2030 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ අරමුණින් සැලැසුම් සකස් කළ යුතු වීම. | කඩිනමින් නිවැරදි කිරීමට සටහන් තබාගත් බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | -------------------------------- |
| (අ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09 ක තනතුරු 75 කට අදාළව නිලධාරීන් 170 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතුකර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | පාලනයෙන් බැහැර විවිධ හේතු පැනනැගීමෙන් මෙසේ සිදුවන බවත් නව බඳවා ගැනීම් සමඟ ඒ සඳහා විසඳුම් ලබාදීමට අපේක්ෂා කරන බව. |
| (ආ) | ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 180 ක් සඳහා කිසිදු පුහුණුවක් ලබාදී නොතිබුණි. | නිලධාරීන් පුහුණු කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී එම අවශ්‍යතාවය පරිදි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව. |
| (ඇ) | ලග්ගල - පල්ලේගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මධ්‍යම රජයේ විවිධ ආයතන වෙනුවෙන් අනුයුක්ත කළ යුතු ක්ෂේත්‍ර නිලධාරීන් 49 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | නව බඳවා ගැනීම් සමඟ ඒ සඳහා විසඳුම් ලබාදීමට අපේක්ෂා කරන බව. |
| (ඉ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 ක සංවර්ධන නිලධාරීන් 10 දෙනෙකු ග්‍රාම නිලධාරි වසම් 40 ක් සඳහා අනුයුක්ත කර තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | නිලධාරීන්ගේ ඌණතාවය හමුවේ විසඳුම් ලෙස අලුතින් බඳවාගනු ලබන අය අනුයුක්ත කිරීමට අපේක්ෂා කරන බව. |
| (ඊ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක නිලධාරීන් 12 ක ගේ අතිරික්තයක් පවතින බව අනාවරණය විය. | පුරප්පාඩු පවතින කාර්යාල සඳහා අතිරික්ත නිලධාරීන් යෙදවිය යුතු වීම. | ප්‍රායෝගිකව වෙනත් සේවයන් වල ඌණතාවයන් එම නාමික අතිරික්ත සේවයන් දරන අයවලුන් මඟින් ඌණපූරණය කර ගන්නා බව. |